31

SMRIP/ES/01/06/අභ්‍යන්තර චක්‍රලේඛ 2021.03.15

අමාත්‍යාංශ චක්‍රලේඛ : 05/2021

සියළුම දිස්ත්‍රික් විද්‍යා නිලධාරීන්,
සියළුම මධ්‍යස්ථාන භාර විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්,

**ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අනෙකුත් ආයතන සමඟ ඒකාබද්ධව / සහයෝගයෙන් කටයුතු කිරීම.**

අමාත්‍යාංශය විසින් මීට පෙර සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ වලට අමතර වශයෙන් මෙම මාර්ගෝපදේශ චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

රජයේ ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීමේ ප්‍රධාන වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්වල තාක්ෂණික සහයෝගය එම නිලධාරීන්ගේ / ප්‍රාදේශීය ලේකම්ගේ ඉල්ලීම් අනුව ඉටු කරලිය යුතු බව කාරුණිකව දන්වමි. ඊට අමතරව වෙනත් සහයෝගයක් අවශ්‍ය අවස්ථාවන්හිදී එම සහයෝගයද ලබා දීමට කටයුතු කළ යුතුවේ.

1. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩසටහන්
2. මානව සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩසටහන්
3. ජාතික ශිල්ප සභාවේ (NCC) වැඩසටහන්
4. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ (NEDA) වැඩසටහන්
5. කාර්මික සංවර්ධන මණ්ඩලයේ (IDB) වැඩසටහන්
6. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ (SED) වැඩසටහන්
7. අනෙකුත් ප්‍රාදේශීය ආයතනවල වැඩසටහන්

මෙම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහාද ඉහත සඳහන් ආයතන සහ රාජ්‍ය බැංකු වල සහයෝගය විශේෂයෙන් ලබා ගත යුතුවේ. මෙම උපදෙස් නිකුත් කරනු ලබන්නේ ඒ ඒ ආයතනවල විශේෂඥතාවයන් ප්‍රයෝජනයට ගෙන ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් වඩාත් ඵලදායීව ඉටු කිරීම හා රජයේ වියදම් අවම කිරීමේ අරමුණින් බවද වැඩිදුරටත් දන්වමි.

උදා :- * අලෙවිකරණ සංවර්ධන වැඩසටහන් පැවැත්වීමේදී අනෙකුත් ආයතන සමඟ සම්බන්ධවී කටයුතු කිරීම
* පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අදාළ ආයතන වල විශේෂඥ සම්පත්දායකත්වය ලබා ගැනීම

**එම්.ඒ.බී.වී. බණ්ඩාරනායක,**
ලේකම්,
වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.

පිටපත් :-
1) ලේකම්, මුදල් අමාත්‍යාංශය
2) ලේකම්, කර්මාන්ත අමාත්‍යාංශය
3) ලේකම්, තරුණ හා ක්‍රීඩා අමාත්‍යංශය
4) ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යංශය
5) අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
6) සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
7) සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්